# ඉතිහාසය

# 09 ශ්‍රේණිය

## කාර්ය පත්‍රිකා සංග්‍රහය





කලාප අධ්‍යාපන කාර්යාලය
අම්පාර

# 9 ශ්‍රේණිය

# ඉතිහාසය කාර්ය පත්‍රිකා ගොනුව

## <u>කලාප අධ්‍යාපන කාර්යාලය අම්පාර</u>



ඉතිහාසය 9 ශ්‍රේණිය කාර්ය පත්‍රිකා අංක 1

පාඩම/ ඒකකය - ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම
ගුරුවරයාගේ නම - W.ශානිකා සුබාශිනි - අම්/වැරැන්කැටගොඩ ජාතික පාසල

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- 1 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ලන්දේසීන් ආසියාවට පැමිණි වර්ශය වන්නේ
   - I. 1638
   - II. 1658
   - III. 1602
   - IV. 1618
2. උඩරටට පැමිණි පළමු ලන්දේසි දූතයා වන්නේ
   - I. ජොරිස් වැන් ස්පිල්බර්ජන්
   - II. සිබෙල් ද වැට්
   - III. රොබට් ඇන්ඩෘස්
   - IV. ජෙරාල්ඩ් හල්ෆ්ට්
3. දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර ප්‍රථම ගිවිසුම ඇති වූ වර්ෂය වන්නේ
   - I. 1602
   - II. 1638
   - III. 1658
   - IV. 1766
4. ලන්දේසීන් විසින් අල්ලාගත් මුහුදුබඩ ප්‍රදේශයක් නොවන්නේ
   - I. මාතර
   - II. ත්‍රිකුණාමලය
   - III. කල්පිටිය
   - IV. මහනුවර
5. සිංහල රජු ලන්දේසි දූතයන්ට ලබාදුන් ලබා දුන් තෑග්ගක් වන්නේ
   - I. අශ්වයින් දෙදෙනෙක්
   - II. රන් මාලයක්
   - III. සඳුන් දැව
   - IV. පර්සියන් බැටළුවන් දෙදෙනෙක්
6. ප්‍රථම ඉංග්‍රීසි දූත වරයා ලංකාවට පැමිණෙන විට උඩරට පාලනය කළ රජු වන්නේ
   - I. දෙවන රාජසිංහ රජු
   - II. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
   - III. රාජාධි රාජසිංහ රජු
   - IV. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
7. ලන්දේසීන්ගේ පාලන ප්‍රදේශයේ බෙදුනු කොටස් තුන වන්නේ
   - I. කොළඹ,ගාල්ල, මාතර
   - II. ගාල්ල, මාතර, මඩකලපුව
   - III. කොළඹ, ගාල්ල, යාපනය
   - IV. කොළඹ, මාතර, යාපනය
8. කුරුඳු සම්බන්ධව තිබූ දෙපාර්තමේන්තුව හැඳින්වූ නම කුමක්ද
   - I. මහා බද්ධුය දෙපාර්තුමේන්තුව
   - II. කුරුවේ බද්ද දෙපාර්තමේන්තුව
   - III. කොට්කා බද්ද දෙපාර්තමේන්තුව
   - IV. කින්නර බද්ද දෙපාර්තමේන්තුව
9. ලන්දේසීන්ගේ ආගම වන්නේ
   - I. ක්‍රිස්තියානි
   - II. රෝමානු කතෝලික
   - III. රෙපරමාදු
   - IV. ප්‍රොතෙස්තන්ත්‍රවාදය
10. ලන්දේසීන්ගෙන් ලංකා සමාජයට ලැබුණු බලපෑමක් නොවන්නේ
    - I. උසාවි ක්‍රමය
    - II. මෙරටට බර්ගර් ජනතාව එකතු වීම
    - III. උඩ වහල යෙදූ කුළුනු සහිත ගොඩනැගිලි
    - IV. කපිරිඤ්ඤා වාද බයිලා සංගීතය

## II කොටස

11. 01. වෙළදාම සඳහා ආසියාවට පැමිණි ලන්දේසීන් ගේ මව් රට කුමක්ද

02. ලන්දේසීන් ආසියාව තුළ තුල ගොඩනගාගත් වෙළඳ සමාගමේ නම ලියන්න

03. වෙළෙඳ සමාගම පිහිටුවා ගත් ස්ථානය නම් කරන්න

12. 01. ලන්දේසීන් ලංකාවට මුලින්ම පැමිණි වර්ෂය ලන්දේසි ජාතිකයා ගොඩබස්වා ලද ස්ථානය පිළිවෙලින් ලියන්න

02. ඔවුන් මෙරටට ගොඩබසින විට දී ලංකාවේ පැවති රාජධානිය හා පාලනය කළ රජු නම් කරන්න .

03. ජොරිස් වැන් ස්පිල්බර්ජන් ගෙන් පසු පැමිණි අනෙක් ලන්දේසි දූතයාගේ නම ලියන්න

13. 01. පෘතුගීසීන් මෙරට ලංකාවේ වෙරළබඩ කලාපයෙන් පන්නා දැමීමට නම් ඊට සමාන නාවුක බලයක් ඇති පිරිසකගේ ආධාර ලබාගත යුතු බව තීරණය කළ රජු ගේ නම ලියන්න

02. එම රජු හා ලන්දේසීන් අතර එකඟතාවයක් ඇති වූ වර්ෂය ලියන්න

03. වසර 20 ක යුද්ධයක් පැවතියේ කුමන පාර්ශවයන් දෙක අතර ද

14 01. ලන්දේසි ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලන බලය තහවුරු කරගත් වර්ෂය ලියන්න.

02. ලන්දේසීන්ගේ පාලන මධ්‍යස්ථානය පිහිට වූ ස්ථාන කිහිපයක් නම් කරන්න

15 මහනුවර රාජදානියේ බලයට පත්වූ පත් වූ දෙවන රාජසිංහ රජුගෙන් පසු බලයට පත්වූ රජවරු දෙදෙනෙක් නම් කරන්න

16 01. නායක්කාර වංශික රජවරු හතරක් නම් කරන්න

02. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස පැමිණි ඉංග්‍රීසි දූත වරයාගේ නම හා පැමිණි වර්ෂයේ ලියන්න

17 ශ්‍රී ලංකාවේ පැවති ලන්දේසි ප්‍රදේශයන් පාලනය පහසුව වෙනුවෙන් බෙදා දක්වන ලද ඒකකයන් තුන නම් කරන්න

18 පහත සඳහන් ප්‍රදේශයන් පාලනය සිදු කරන ලද නිල තනතුරු ලියන්න

1. කොළඹ කොමාන්ඩරිය
2. ගාල්ල හා යාපනය කොමාන්ඩරිය
3. දිසාවනිය
4. කෝරළය
5. පත්තු
6. ගම්
7. ලන්දේසි හමුදා සංවිධානයේ නායකයා
8. වෙළඳ අංශයේ නායකයා

19 01. ලන්දේසීන්ගේ අධිකරණයේ බෙදා දක්වන උසාවි වර්ග නම් කරන්න

02. කොම්බුවක් යනු කුමක්දැයි හඳුන්වා තෝම්බු වර්ග තුනක් නම් කරන්න

20 01. ලන්දේසීන්ගේ ආර්ථික වාසි ලබාගැනීම වෙනුවෙන් සිදුකරන ලද ප්‍රතිසංස්කරණ තුනක් නම් කරන්න

02. ලන්දේසීන්ගෙන් ලංකා සමාජය වෙත ලද ආගම අධ්‍යාපනය සංස්කෘතිය යන අංශ පිළිබඳ කෙටියෙන් හැඳින්වීමක් කරන්න

ඉතිහාසය 9 ශ්‍රේණිය කාර්ය පත්‍රිකා අංක 2

පාඩම/ ඒකකය - ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම
ගුරුවරයාගේ නම - W.ශානිකා සුබාශිනි - අම්/වැරන්කැටගොඩ ජාතික පාසල

1. ඉංග්‍රීසීන් ලංකාවට පැමිණි වර්ශය වන්නේ
   I. 1658
   II. 1615
   III. 1796
   IV. 1803

2. ක්‍රිස්තු වර්ෂ 1762 වර්ෂයේදී ලංකාවට පැමිණි ඉංග්‍රීසි දූත වරයා සහ ඒ සමයේ උඩරට පාලනය කළ රජුගේ නම වන්නේ
   I. ජෝන් පයිබස් - පළමුවන විමලධර්මසූරිය රජු
   II. හියු බොයිඩ් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු
   III. ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු
   IV. ජෝන් පයිබස් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

3. 1792 ඉංග්‍රීසීන්ට විරුද්ධව පහත රට වැසියන් සිදුකළ කැරැල්ල පිළිබඳ ව පිළිබඳව සොයා බැලීම සඳහා බ්‍රිතාන්‍යයන් ගෙන ආ කොමිසම වන්නේ
   I. මියුරන් කොමිසම
   II. ඩොනමෝර් කොමිසම
   III. කෝල්බෲක් කොමිසම
   IV. සෝල්බරි කොමිසම

4. සිංහල රාජාවලිය අවසාන රජු හා රාජාවලියේ අවසාන රජු වශයෙන් හැඳින්වෙන්නේ
   I. දෙවන රාජසිංහ රජු හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු
   II. පළමුවන විමලධර්මසූරිය රජු හා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය
   III. ශ්‍රී වීර පීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ රජු හා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
   IV. දෙවන රාජසිංහ රජු හා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

5. සමස්ත ශ්‍රී ලංකාවම ඉංග්‍රීසීන් යටතට පත් වූ වර්ෂය වන්නේ
   I. 1798
   II. 1802
   III. 1815
   IV. 1848

6. උඩරට ගිවිසුම අත්සන් කරන විට දී මෙරට පාලනය කළ ආණ්ඩුකාරවරයාගේ නම වන්නේ
   I. ෆෙඩ්රික් නෝර්ත්
   II. තෝමස් මෙට්ලන්ඩ්
   III. රොබට් බ්‍රවුන්රිග්
   IV. ටොරින්ටන් සාමි

7. බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව සිංහලයන් විසින් කැරලි දෙකක් ඇති කළ වර්ෂ දෙක පිළිවෙලින් ලියන්න
   I. 1798 හා 1802
   II. 1803 හා 1815
   III. 1818 හා 1840
   IV. 1818 හා 1848

8. පළමු නිදහස් සටනට සම්බන්ධ නායකයකු නො වන්නේ
   I. කැප්පෙටිපොළ නිළමේ
   II. වීර පුරන් අප්පු
   III. බූටැවේ රටේ රාල
   IV. කොහුකුඹුරේ රාල

9. 1848 නිදහස් සටන් අරගල ය අරගලය වන වන විට මෙරට පාලනය කර බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වන්නේ
   I. ටොරින්ටන් සාමි
   II. ෆෙඩ්රික් නෝර්ත්
   III. රොබට් බ්‍රවුන්රිග්
   IV. එඩ්වඩ් බාන්ස්

10. දෙවන නිදහස් සටනට අයත් නායකයකු නොවන්නේ
   I. ගොංගාලේගොඩ බණ්ඩා
   II. මඩුගල්ලේ දිසාව
   III. වීර පුරන් අප්පු
   IV. ඩිංගිරාළ

11.

I. බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න

II. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවෙන් ගෙන ගිය වෙළඳ භාණ්ඩ හතරක් නම් කරන්න

12. උඩරට රාජ්‍යය හා ඉංග්‍රීසීන් අතර ප්‍රධාන දූත මාර්ග මඟින් පහත වගුව සම්පූර්ණ කරන්න

| වර්ෂය | දූත වරයාගේ නම | සිංහල රජුගේ නම |
|---|---|---|
| | | |
| | | |
| | | |

13.

I. කිච් ලිපිය පිළිබඳ හැඳින්වීමක් කරන්න

II. කිච් ලිපිය ලිව්වේ කවුද

III. කිච් ලිපිය ලිව්වේ කාටද

IV. කිච් ලිපිය ලිවීමට හේතුව කුමක්ද

V. කිච් ලිපිය ලිව්වෙ කුමන ස්ථානයේ සිට ද

14. බ්‍රිතාන්‍යයන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය බලය තහවුරු කරගත් වර්ෂය ලියන්න

15.

I. ක්‍රිස්තු වර්ෂ 1796 - 1815දක්වා ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ වල බ්‍රිතාන්‍ය පාලනය ගෙනගිය ප්‍රධාන ප්‍රධාන අවස්ථා තුනක් ලියන්න

II. ද්විත්ව පාලනය කෙටියෙන් හඳුන්වන්න

16.

I. උඩරට රාජ්‍යය ස්වාධීන රාජ්‍යයක් ව හොඳට නොවිච්ච ස්වාධීන රාජ්‍යයක් ව පැවතීම බාධාවක් වූ බ්‍රිතාන්‍යයන් උඩරට ආක්‍රමණය සඳහා යොමු වූ හේතු සඳහන් කරන්න

II. උඩරට ආක්‍රමණය කළ වර්ෂය ලියන්න

III. ඉංග්‍රීසින්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වූයේ ඇයි

IV. උඩරට ආක්‍රමණය කරන විට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කර බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා හා සෙන්පතියා නම් කරන්න

17.

I. රාජාධිරාජසිංහ රජුගෙන් පසු රජකමට උරුමකම් කී කුමාරවරු දෙදෙනාගේ නම් ලියන්න ඔවුන්ට සිදුවූයේ කුමක්ද

II. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයේ උඩරට රාජ්‍යය තුළ සිදු වූ අභ්‍යන්තර අර්බුද කීපයක් නම් කරන්න

18. උඩරට ගිවිසුම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

19. 1818 පළමු නිදහස් සටන හා 1848 දෙවන නිදහස් සටන පිළිබඳ පිළිබඳ වෙන වෙනම හැඳින්වීමක් කරන්න

20.

I. බ්‍රිතාන්‍යයන් වතු වගාව ආරම්භ කිරීමට පෙර මෙරට පැවති ආර්ථික තත්ත්වය කෙසේ සකස් වී ද

II. බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණය කුමක්ද

III. බ්‍රිතාන්‍යයන් රජයේ ආදායම වැඩිකර වැඩිකර ගැන කර ගැනීම සඳහා රජයේ වියදම අඩු කර ගැනීම සඳහා සිදුකරන ලද ක්‍රියාමාර්ග දෙක බැගින් ලියන්න

21.

I. බ්‍රිතාන්‍යයන් ආර්ථික භෝගයක් ලෙස භෝගයක් ලෙස මෙරට වගා කළ බෝග වර්ග හතරක්

II. ලංකාවේ ප්‍රථම කෝපි වත්ත ඇති වූයේ කුමන ස්ථානයක ද

III. කෝපි වගාව විනාශ වූයේ කුමන දිලීර රෝගය වැළඳීමෙන් ද

22. .

I. තේ වගාව ලංකාවට මුලින්ම හඳුන්වා දුන්නේ කවුද කවුද වර්ෂය හා වතුයායේ නම ලියන්න.

II. තේ වගාව මෙරට ප්‍රමුඛ අපනයන ආර්ථික භෝගය බවට පත්වීමට බලපෑ හේතු සඳහන් කරන්න.

ඉතිහාසය 9 ශ්‍රේණිය
පාඩම / ඒකකය :- (තෙවන ඒකකය) ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය
ගුරුවරයාගේ නම :- ප්‍රසන්න ප්‍රදීප් කුමාර (0703781842 අම්/ගාමිණී මහා විද්‍යාලය

1) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ආගම ප්‍රචාරය කිරීම සඳහා මෙරටට පැමිණි මිෂනාරී සංවිධාන ගණන වන්නේ,
(1) 6 (2) 8 (3) 5 (4) 3

2) පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන ආරම්භ කරන ලද්දේ,
(1) 1875 (2) 1873 (3) 1874 (4) 1897

3) බෞද්ධ පාසල් ගොඩනැගීමේ ක්‍රියාවලිය තුළ පුරෝගාමීව කටයුතු කළ ඇමරිකන් ජාතිකයා වන්නේ,
(1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා (2) අනගාරික ධර්මපාල මහතා
(3) හෙලේනා බ්ලැවැට්ස්කි මැතිණිය (4) ජෝන් ද සිල්වා මහතා

4) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් පැවැත් වූ පඤ්ච මහා වාදයන් අතුරින් වැඩි ජනප්‍රියත්වයක් හිමිකර වාදය වූයේ,
(1) ගම්පොළ වාදය (2) පානදුරා වාදය
(3) උදම්මිට වාදය (4) බද්දේගම වාදය

5) ''ගවමස් නොකනු, මත්පැන් නොබනු'' යන උදාර පාඨය තම රථයේ ගසා ප්‍රදර්ශනය කිරීමට ක්‍රියාකළ ජාතික නායකයා වන්නේ,
(1) අනගාරික ධර්මපාලතුමා (2) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
(3) වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා (4) පියදාස සිරිසේන මැතිතුමා

6) කොළඹ සහීර විද්‍යාලය ආරම්භ කරන ලද මුස්ලිම් ජාතික නායකයා වන්නේ ,
(1) ටී. බී. ජයා මහතා (2) ආරුමුග නාවලර්තුමා
(3) පොන්නම්බලන් රාමනාදන් මහතා (4) ඇම්. සී. සිද්දි ලෙබ්බේ මහතා

7) 1915 දී සිදු වූ සිංහල - මුස්ලිම් කෝලහලයේදී අසාධාරණයට පත් සිංහල නායකයින් වෙනුවෙන් පෙනී සිටි දමිළ ජනනායකයා වන්නේ,
(1) පොන්නම්බලම් රාමනාදන් මහතා (2) පොන්නම්බලම් අරුණාචලම් මහතා
(3) ආරුමුග නාවලර් තුමා (4) ටී. බී. ජයා මහතා

8) වෙසක් පොහෝ දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත් කිරීමට පුරෝගාමීව කටයුතු කරන ලද්දේ,
(1) අනගාරික ධර්මපාලතුමා (2) වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා
(3) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා (4) දොන් ස්ටෙපර් සේනානායක මහතා

9) ක්‍රි. ව. 1862 දී මෙරට ආරම්භ කළ ප්‍රථම බෞද්ධ මුද්‍රණාලය වන්නේ,
(1) කවට කතික මුද්‍රණාලය (2) සරසවි සඳරැස මුද්‍රණාලය
(3) ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය (4) සුදර්ශන මුද්‍රණාලය

10) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය යටතේ පවත්වන ලද වාද විවාද අතරින් වාද විවාදයන් (A) තීරයේද එම වාද විවාද පැවැත්වූ වර්ෂ (B) තීරයේද දක්වා ඇත. ඒවා නිවැරදි ලෙස සම්බන්ද කරමින් යා කරන්න.

| A | B |
|---|---|
| (1) බද්දේගම වාදය | 1873 |
| (2) ගම්පොළ වාදය | 1865 |
| (3) පානදුරා වාදය | 1866 |
| (4) උදම්විට වාදය | 1871 |

1.

1) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ආගම ප්‍රචාරය කිරීම සඳහා මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන 04 ක් නම් කරන්න.

2) මිෂනාරි සංවිධාන ගෙන ගිය ආගම ප්‍රචාරය කිරීමේ කටයුතු වලදී ඉවහල් කර ගත් ක්‍රමවේද 03ක් දක්වන්න.

3) ඔවුනට එම කටයුතු වඩාත් සාර්ථක කර ගැනීම සඳහා බලපෑ හේතු සාධක 3ක් සඳහන් කරන්න.

2.

1) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 4ක් දක්වන්න.

2) එම ලක්ෂණ අතුරින් ලක්ෂණ 03ක් පිළිබඳ කරුණු දෙක බැගින් සඳහන් කරන්න.

3.

1) බෞද්ධ පුනර්ජීවන ක්‍රියාවලිය තුළ ආරම්භ කළ බෞද්ධ පාසල් 4ක් නම් කරන්න.

2) එම ප්‍රබුද්ධ ක්‍රියාවලිය තුළ අනගාරික ධර්මපාල තුමාගෙන් ඉටු වූ ජාතික සේවාවන් 04 ක් සඳහන් කරන්න.

4.

1) විශිෂ්ඨ ජන නායකයකු ලෙසින් ටී.බී. ජයා මහතා කරුණු 03 ක් සඳහන් කරමින් අගය කරන්න.

2) මිෂනාරි ක්‍රියාකාරිකයන් නිසා අභියෝගයට ලක් වූ සිය ආගමික හා සංස්කෘතික උරුමයන් රැකගැනීමට ආරුමුග නාවලර්තුමා ක්‍රියාවට නැන් වූ කරුණු 04ක් ලියා දක්වන්න.

5. පහත සඳහන් පුද්ගලයින් අතුරින් දෙදෙනෙක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

2) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

3) ඇම්.සී.සිද්දි ලෙබ්බේ මැතිතුමා

4) ආරුමුග නාවලර්තුමා

6. 1) බෞද්ධ පුනර්පිවනය යටතේ නිකුත්වූ ප්‍රථම බෞද්ධ පුවත්පත කුමක්ද

2) යාපනය හින්දු විද්‍යාලය ලෙස ප්‍රචලිත වූයේ කුමන පාසලද

3) බෞද්ධ පුනරුදය වෙනුවෙන් ගොඩනැගු පරම විඥානාර්ථ සමාගම පිහිටුවීමේ පුරෝගාමියා කවුද

4) පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටවු හිමිනම නම්කරන්න

5) ආරුමුග නාවලර්තුමා ආරම්භ කරන ලද පුවත්පත කුමක්ද

7. 1) පහත සඳහන් මිෂනාරි සමාගම් ක්‍රියාත්මක වූ ස්ථාන නම්කරන්න

1 බැප්ටිස් මිෂනාරි සමාගම

2 වෙස්ලියන් මිෂනාරි සමාගම

3 චර්ච් මිෂනාරි සමාගම

2) බෞද්ධ ප්‍රබෝධය ඇතිකිරීම සදහා අනාගාරික ධර්මපාලතුමාගේ සේවාව පැහැදිලි කරන්න

ඉතිහාසය - 09 ශ්‍රේණිය

විෂයය ඒකකය: ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය

නම: ඒ.එම්.අජන්තා චන්ද්‍රකාන්ති (071-3803010) - අම්/දමන මහා විද්‍යාලය

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ක්‍රි.ව.1498 දී ඉන්දියාවට පැමිණි පෘතුගීසි ජාතිකයා වන්නේ,

I. මැගලන් II. වස්කෝ ද ගාමා

III. කොලොම්බස් IV. බර්තොලමියු ඩයස්

02. VOC සමාගම යනු,

I. පෙරදිග බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගම II. පෙරදිග පෘතුග්‍රීසි වෙළෙඳ සමාගම

III. පෙරදිග ප්‍රංශ වෙළෙඳ සමාගම IV. පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම

03. ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණෙන විට සිටි මුගල් අධිරාජයා වන්නේ,

I. ජහන්ගීර් II. බාබුර් III. මහා අක්බාර් IV. බහදූර්ෂා

04. ඉන්දියාව තුළ පිහිටි ප්‍රංශ බලකොටුවකි,

I. ගෝව II. බොම්බාය III. මද්‍රාසිය IV. පොන්ඩිචේරි

05. ඉන්දියානු ජාතික සංගමය පිහිටුවන ලද වර්ෂය වන්නේ,

I. 1885 II. 1888 III. 1889 IV. 1890

06. “ස්වරාජ්‍ය යනු මගේ ජන්ම උරුමයකි. එය මම ලබා ගනිමි” යන ප්‍රකාශය කළ ඉන්දියානු නායකයා වූයේ,

I. මංගල් පාන්ඩේ II. බාල් ගංගාධාර් තිලක්

III. ජවහර්ලාල් නේරු IV. දඩාබායි නඕරෝජී

07. හින්දු පුනරුද ව්‍යාපාරයේ පුරෝගාමියා වනුයේ,

I. ඇලන් ඔක්ටවියන් හියුම් II. මොහොමඩ් අලි ජින්නා

III. මවුලානා අබුල් කලාම් අසාද් IV. රාම් මෝහන් රෝයි

08. ඉන්දියානු ජාතින නිදහස් දිනය වන්නේ,

I. 1945 ජනවාරි 04 II. 1946 සැපිතැම්බර් 15

III. 1947 අගෝස්තු 15 IV. 1948 පෙබරවාරි 04

09. ඉන්දියානුවන් ඉංග්‍රීසීන්ගේ ලුණු සම්බන්ධ නීති වලට විරෝධය පෑමට ගෙන ගිය ව්‍යාපාරය වන්නේ,

I. දණ්ඩි පා ගමන II. ඛේඩා ව්‍යාපාරය

III. සත්‍යාග්‍රහ ව්‍යාපාරය IV. අවිහිංසාවාදී ව්‍යාපාරය


10. “අවිහිංසාවාදයේ පියා” ලෙස සැලකෙන ඉන්දියානු නායකයා වන්නේ,

I. ඩබ්ලිව්. සී බෙනර්ජි II. බිපන් චන්ද්‍රපාල්

III. ලාල් ලජ්පත්රායි IV. මහත්මා ගාන්ධි

- සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

01.



a) මෙම රූපයේ දැක්වෙන ඉන්දියානු නායකයා නම් කරන්න.

b) ඉන්දියානු නිදහස් සටනේ දී මෙතුමා අනුගමනය කළ සටන් උපක්‍රම තුනක් සඳහන් කරන්න.

c) මෙතුමා ලංකාවට පැමිණි වර්ෂය ලියන්න.

02. I. ආසියාවේ පෘතුගීසි හා ලන්දේසි බලය පැතිරවීමට ක්‍රියාකළ නිලධාරීන් දෙදෙනා පිළිවෙලින් නම් කරන්න.

II. පෘතුගීසින්ගේ පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානය පිහිටි ස්ථානය නම් කරන්න.

III. ඉංග්‍රීසින් ඉන්දියාව තුළ තම බලය පැතිරවීම සඳහා අනුගමනය කළ උපායශීලී ප්‍රතිපත්ති දෙක සඳහන් කරන්න.

03. "ඉංග්‍රීසීන් විසින් අලුතෙන් නිපදවන ලද එන්පීල්ඩ් නම් රයිපල් වර්ගය භාවිත කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා සිපොයි කැරැල්ල ඇති විය".

I. සිපොයි භටයන් යනු කවුරුන්ද ?

II. සිපොයි කැරැල්ල ඇතිවූ වර්ෂය ලියන්න.

III. සිපොයි භටයන් එම රයිපල් වර්ගය ප්‍රතික්ෂේප කිරීමට හේතුව කුමක් ද?

IV. ඉහත සඳහන් කැරැල්ල අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් හා කැරැල්ලේ ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.

04. I. ඉන්දියානු ජාතික සංගමයේ නිර්මාතෘවරයා නම් කරන්න.

II. ඉන්දියාවේ "සම්භාවනීය මහල්ලා" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූ නායකයා නම් කරන්න.

III. නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැතිවරයා නම් කරන්න.

IV. ඉන්දියානු ජාතික සංගමය තුළ සිටි මධ්‍යස්ථ මතධාරී හා අන්තගාමී අදහස් දැරූ නායකයන් දෙදෙනෙකු බැගින් නම් කරන්න.

05. ඉන්දියානු නිදහස් සටන හා සම්බන්ධ පහත සිදුවීම් කෙටියෙන් පැහැදිලි කරන්න.

I. ජලියන්වලා බාග් ඛේදවාචකය

II. චම්පරන් ව්‍යාපාරය

III. ඛේඩා ව්‍යාපාරය

| | |
|---|---|
| විෂය | - ඉතිහාසය 9 ශ්‍රේණිය |
| පාඩම් ඒකකය | - ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය |
| ගුරුභවතාගේ නම | - ශානිකා සුභාෂිණී මිය - අම්/වැරැන්කැටගොඩ ජාතික පාසල |

- කෙටි ප්‍රශ්න සඳහා අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ ප්‍රතිසංස්කරණය ලංකාව තුළ ඇති වූ වසර වන්නේ
   I. 1815 III. 1833
   II. 1818 IV. 1848
2. කෝල්බෲක් ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණයක් නොවන්නේ
   I. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
   II. සර්වජන ඡන්ද බලය ලැබීම
   III. උඩරට හා පහතරට ඒකාබද්ධ පාලනයක් ඇති කිරීම
   IV. අනිවාර්ය රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
3. කෲමැකලම් ප්‍රතිසංස්කරණයේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් ගණන වන්නේ
   I. 15 III. 21
   II. 37 IV. 49
4. උගත් ලාංකිකයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායක මණ්ඩලය වෙත පත් වූ පළමු ශ්‍රී ලාංකිකයා වන්නේ
   I. සර් ජේම්ස් පීරිස් III. පොන්නම්බලම් අරුණාචලම්
   II. පොන්නම්බලම් රාමනාදන් IV. ඩී එස් සේනානායක මහතා
5. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වන්නේ
   I. පොන්නම්බලම් අරුණාචලම් III. ඒ ඊ ගුණසිංහ
   II. පොන්නම්බලම් රාමනාදන් IV. ඩී එස් සේනානායක මහතා
6. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ප්‍රතිසංස්කරණය හඳුන්වා දුන් වර්ෂය වන්නේ
   I. 1924 III. 1947
   II. 1931 IV. 1972
7. රාජ්‍ය නිලධාරීන් තිදෙනා දැක්වෙන්නේ
   I. රාජ්‍ය ලේකම්, නීති ලේකම්, මුදල් ලේකම්
   II. රාජ්‍ය ලේකම් සෞඛ්‍ය ලේකම් මුදල් ලේකම්
   III. ආන්ඩුකාරවරු රාජ්‍ය ලේකම් නීති ලේකම්
   IV. ආන්ඩුකාරවරු මුදල් ලේකම් රාජ්‍යලේකම්
8. ආණ්ඩුකාරධූරය අග්‍රාණ්ඩුකාර ධූරය බවට පත්වූ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ
   I. 1931 ඩොනමෝර්
   II. 1947සෝල්බරි
   III. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව
   IV. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව

9. ප්‍රථම ආණ්ඩුකාරවරයා වශයෙන් හඳුන්වන්නේ

I. රොබට් බ්‍රවුන්රිග්   III. හෙන්රි මේසන් මුවර්

II. ටොරින්ටන් සාමි   IV. සර් ඔලිවර් ගුණතිලක

10. සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයක් නොවන්නේ

I. ද්විමණ්ඩල පාර්ලිමේන්තුව
II. විධායක කාරක සභා පිහිටුවීම
III. අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම
IV. රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

11. 1833 වර්ෂයේ සිට 1947 වර්ෂය දක්වා ලංකාවට බ්‍රිතාන්‍යයන් ලබාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන් පිළිවෙලට වර්ෂයත් සමග ලියන්න

12. .

I. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ ප්‍රතිසංස්කරණයේ විශේෂ ලක්ෂණ ලියන්න
II. එම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යේ ව්‍යුහය (සැලැස්ම ) ඇඳ දක්වන්න
III. කෝල්බෲක් යෝජනා ප්‍රතිසංස්කරණයේ දී ලංකාව බෙදුණු පලාත් පාලන ආයතනය පහ සහ පරිපාලන මධ්‍යස්ථාන ලියන්න

13. .

I. විසි වැනි සියවසේ දී ලංකාව තුළ බිහි වූ බිහි වූ ඉංගවූ ඉංග්‍රීසි උගත් මධ්‍යම පන්තිය ලෙස හඳුන්වන්නේ කුමන පිරිස් ද යන්න පැහැදිලි කරන්න
II. උගත් ලාංකික මධ්‍යම පංතියේ අතරින් දේශපාලන උද්ඝෝෂණයට නායකත්වය දුන් පුද්ගලයින් කීප දෙනෙක් නම් කරන්න

14.

I. ලංකා ජාතික සංවිධානයට එකතු අනෙක් සංවිධාන කීපයක් නම් කරන්න
II. 1919පිහිටවූ ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති වරයාගේ නම කුමක්ද

15. ලංකාවට සීමිත ඡන්ද බලයක් ලබා දුන් 1924 මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ව්‍යුහය ඇඳ දක්වන්න

16. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලාංකිකයන්ට ලැබුණු විශේෂ ලක්ෂණ මොනවාද

17. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ව්‍යුහය ඇඳ දක්වන්න

18.

I. විධායක කාරක සභා 7 නම් කරන්න
II. රාජ්‍ය නිලධාරීන් තුනක් නම් කරන්න

19. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ නම් කරන්න

20.

I. පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙක හඳුන්වා සාමාජිකයන් ගණන නම් කරන්න
II. රාජ්‍ය සේවා කොමිෂම හා අධිකරණ සේවා කොමිසම කෙටියෙන් හඳුන්වන්න

| | | |
|---|---|---|
| විෂය | - | ඉතිහාසය 09 ශ්‍රේණිය |
| පාඩම් ඒකකය | - | නිදහසින් පසු ශ්‍රී ලංකාව |
| ගුරුභවතාගේ නම | - | ශානිකා සුභාෂිනි - අම්/ වැරැන්කැටගොඩ ජාතික පාසල |

1. ශ්‍රී ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය සිදු වූ වර්ෂය වන්නේ
   - I. 1924
   - II. 1933
   - III. 1947
   - IV. 1956
2. එම මැතිවරණයෙන් වැඩිම ආසන සංඛ්‍යාවක් ලබාගත් පක්ෂය වන්නේ
   - I. එක්සත් ජාතික පක්ෂය
   - II. ලංකා සම සමාජ පක්ෂය
   - III. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
   - IV. මහජන එක්සත් පෙරමුණ
3. 1947 මහ මැතිවරණයෙන් අගමැති තනතුරට පත් වූ පුද්ගලයා වන්නේ
   - I. විලියම් ගොපල්ලව මහතා
   - II. ඩී එස් සේනානායක මහතා
   - III. ඩඩ්ලි සේනානායක මහතා
   - IV. එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මහතා
4. ඩී එස් සේනානායක මහතා අභාවප්‍රාප්ත වූ වර්ෂය වන්නේ
   - I. 1948
   - II. 1952
   - III. 1956
   - IV. 1060
5. හර්තාල් ව්‍යාපාරයක් රටපුරා සිදුවීම නිසා රට පුරා සිදු වීම නිසා තම තනතුරෙන් ඉල්ලා අස් වූ අගමැතිවරයා වන්නේ
   - I. ඩී එස් සේනානායක මහතා
   - II. ජෝන් කොතලාවල මහතා
   - III. ඩඩ්ලි සේනානායක මහතා
   - IV. එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මහතා
6. එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මහතා අගමැති තනතුරට පත් වූ වර්ෂය වන්නේ
   - I. 1952
   - II. 1956
   - III. 1960 මාර්තු
   - IV. 1960 ජුලි
7. පළමු ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දුන් වර්ෂය වන්නේ
   - I. 1956
   - II. 1960
   - III. 1972
   - IV. 1978
8. 1972 ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වන්නේ
   - I. 61
   - II. 101
   - III. 115
   - IV. 168
9. ප්‍රථම නාමික ජනාධිපතිවරයා වන්නේ
   - I. විලියම් ගොපල්ලව මහතා
   - II. ජෝන් කොතලාවල මහතා
   - III. ජේ ආර් ජයවර්ධන මහතා
   - IV. ඒ අමිර්තලිංගම් මහතා
10. වර්තමාන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වන්නේ
    - I. 225
    - II. 196
    - III. 245
    - IV. 296

11. 1948 වර්ෂයෙන් ඇරඹී මහා මැතිවරණයක් පවත්වන ලද වර්ෂයන් පිළිවෙලින් ලියන්න

12. අගමැතිගේ සිට 1972 වර්ෂය දක්වා අගමැතිවරුන්ගේ නාම ලේඛනයක් පිළියෙල කරන්න

~~13. සංඛ මහා බලවේග නම් කරන්න~~

14. 1972පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණයක් ලියන්න

15. ජාතික රාජ්‍ය සභාව කෙටියෙන් හඳුන්වන්න

16. අවසන් ආණ්ඩුකාරවරයා මුල්ම නාමික ජනාධිපති ලෙසින් පත් වූයේ කුමන ප්‍රතිසංස්කරණ තුළින් ද

17. මුල්ම නාමික ජනාධිපතිවරයා ජනාධිපති වරයාගේ නම කුමක්ද

18. ජනාදිපතිගේ නිල කාලය සඳහන් කරන්න

19. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ඉහළ අධිකරණ ආයතන දෙක නම් කරන්න

20. 1972 අධිකරණ ආයතන කිහිපයක් නම් කරන්න

21. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාව හැඳින්වූ නම ලියන්න

22. 1978 ඒ මහ මැතිවරණයෙන් ජයග්‍රහණය කළ පක්ෂය කුමක්ද

23. පක්ෂයේ නායකත්වය ලබා සිටි පුද්ගලයාගේ නම කියුම

24. විපක්ෂ නායකයාගේ නම ලියන්න

25. 1978 විධායක ජනාධිපතිවරයා සතු බලතල පහක් ලියන්න

26. 1978 පාර්ලිමේන්තුව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

27. මූලික මිනිස් අයිතිවාසිකම් හතරක් ලියන්න

28. මෙම මූලික මිනිස් අයිතිවාසිකම් කඩ වුවහොත් කළ හැකි දෙය කුමක්ද

29. බොහොම ජනපද පිහිටුවීමේ දී මූලිකත්වය ගෙන කටයුතු කළ පුද්ගලයන්ගේ නම් ලියන්න

30. මෙසේ ආරම්භ වූ ගොවි ජනපද කිහිපයක් නම් කරන්න

31. ගොවි ජනපද ආරම්භ කිරීමට බලපාන ලද අරමුණු තුනක් දක්වන්න

32. මහවැලි යෝජනා ක්‍රමය යනු කුමක්ද යන්න හඳුන්වන්න

~~33. මහවැලි යෝජනා ක්‍රමය යනු කුමක්ද යන්න හඳුන්වන්න~~

34. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ අරමුණු තුනක් ලියන්න

35. නිදහසින් පසු අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් රජය විසින් ගන්නා ලද පියවර 5ක් ලියන්න

36. සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම වෙනුවෙන් සිදුකළ ක්‍රියාමාර්ග කිහිපයක් ලියන්න

37. ග්‍රාමීය ප්‍රදේශවල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග තුනක් ලියන්න

38.



I. මෙම රූපයේ දැක්වෙන පුද්ගලයාගේ නම ලියන්න

II. මෙතුමිය අගමැති ධුරයට පත් වර්ෂ සඳහන් කරන්න.

III. ලංකා ඉතිහාසයට මෙතුමිය වැදගත්වන්නේ කවර හේතුව නිසාද යන්න හඳුන්වන්න

IV. මෙතුමිය අගමැති තනතුරට පත්වන පක්ෂය සඳහන් කරන්න.

39. .



I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කවුද ?

II. මෙතුමාගේ දේශපාලන පක්ෂය සඳහන් කරන්න.

III. මෙතුමාගේ සිට ඉදිරියට එම තනතුර නම් කරන්න.

IV. 1978 ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා සතු බලතල 2ක් ලියන්න.